# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1989/4 - 2016 ඔක්තෝබර් මස 17 වැනි සඳුදා - 2016.10.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක : IR/22/05/2006 අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධවයි.

**කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2007.06.15 දිනැති හා අංක 1501/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2007.05.21 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් හිගුල, ඇත්වලපිටිය, සම්පත් හි ඒ. පී. එච්. ජී. සී. ජයවීර මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2016.05.11 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2016 ඔක්තෝබර් මස 11 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ කාර්මික අධිකරණයේ දී ය.

ඒ. පී. එච්. ජී. සී. ජයවීර
''සම්පත්'' ඇත්වලපිටිය,
හිගුල.

නඩු අංකය : ඒ - 3214 ඉල්ලුම්කරු (මියගිය)

ආර්. ඒ. රත්නවතී රණසිංහ,
''සම්පත්'' ඇත්වලපිටිය,
හිගුල.

ආදේශිත ඉල්ලුම්කාරිය

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

වගඋත්තරකරු

තීන්දුව සහ ප්‍රදානය

1. ගරු කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍ය ආතාවුද සෙනෙවිරත්න මැතිතුමා විසින් එතුමාගේ අංක IR/22/05/2006 සහ 2007.05.21 දින දරන ලිපිය මගින් ඉහත කී කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පහත නම් සඳහන් මා පත් කරන ලදී.

2. එසේම ඉහත කාර්මික ආරවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ,

   i. සීමා සහිත සබරගමුව බස් සමාගම යටතේ මාවනැල්ල ඩිපෝවට අනුයුක්තව සේවය කරමින් සිටියදී ඒ. පී. එච්. ජී සී. ජයවීර මහතා 2004.09.01 දින සිට බල පවත්නා පරිදි III ඒ ශ්‍රේණියට උසස් කරමින් එම සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ විසින් නිකුත් කරනු ලැබූ 2004.08.30 දිනැති ලිපිය නීත්‍යානුකූල ලිපියක් වශයෙන් සැළකිය හැකි වන්නේද ?

   ii. එය නීත්‍යානුකූල ලිපියක් වන්නේ නම් ඒ අනුව ඒ. පී. එච්. ජී. සී. ජයවීර මහතා III ඒ ශ්‍රේණියට උසස් කිරීම හා හිඟ වැටුප් සඳහා හිමිකම් ලබන්නේ ද? යන්න හා

   iii. ඒ. පී. එච්. ජී. සී. ජයවීර මහතාට ලැබිය යුතු අනෙකුත් සහනයන් කුමක්ද යන්න පිළිබඳවද වේ. යනුවෙන් කම්කරු කොමසාරිස් විසින් නිකුත් කර ඇති ඔහුගේ අංක IR/22/05/2006 සහ 2007.05.17 දින දරන ලිපියේ දක්වා ඇත.

   iv. මෙම ආරවුල සම්බන්ධයෙන් ඉහතකී පාර්ශ්වයන් විසින් අදාළ ප්‍රකාශ ගොනු කළ අතර, සමථයක් ඇති කිරීම සඳහා බේරුම්කරණය විසින් උත්සාහ කළද එවැනි සමථයක් ඇති නොවූ හෙයින් නඩුව විභාගයට ගැනීමට සිදුවිය.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. මේ අනුව ඉල්ලුම්කාර පක්ෂය වෙනුවෙන් ඉල්ලුම්කරුද සී/ස සබරගමුව බස් සමාගමේ හිටපු කළමනාකාර අධ්‍යක්ෂ එස්. ආර්. වයි. පීරිස් මහතාද, යන අය සාක්ෂියට කැඳවමින් නඩු විභාගයේදී ඒ1 සිට ඒ11 දක්වා ලේඛන ලකුණු කරමින් තම නඩුව අවසන් කරන ලදී.

4. අනතුරුව වගඋත්තකාර මණ්ඩලය විසින් තම නඩුව ආරම්භ කරමින් ඩිපෝ මාර්ග පරීක්ෂක ඩබ්ලිව්. පී. කරුණාරත්න මහතා හා කම්කරු සබඳතා අංශයේ විභාග නිලධාරී සහ සහකාර කළමණාකාර මුදල් ටී. ආර්. කපිල තෙන්නකෝන්, පී. ඒ. ධම්මික යන අයවලුන් සාක්ෂියට කැඳවමින් නඩු විභාගයේදී R1 සිට R5 දක්වා සහ X1 සිට X3 දක්වා වූ ලේඛනද ලකුණු කරමින් තම නඩුව අවසන් කරන ලදී.

5. එසේම මෙම නඩුව විමසන අතරතුරදී එනම් 2014.06.22 වන දින ඉල්ලුම්කරු මියගිය බවත්, ඒ සඳහා තමන් ආදේශ කරන ලෙස ඉල්ලුම්කරුගේ නීත්‍යානුකූල බිරිඳ වන ආර්. ඒ. රත්නවතී රණසිංහ යන අය දිවුරුම් ප්‍රකාශයක්ද, ඉල්ලුම්කරුගේ මරණ සහතිකයද, විවාහ සහතිකයද, ඉදිරිපත් කරමින් ඇයව ආදේශ කරන ලෙස බේරුම්කරණයෙන් 2014.10.13 වන දින තම නීතිඥ ඊ. එම්. ගුණපාල මහතා ඉල්ලීමක් කරන ලදින් බේරුම් කරණය විසින් එකී ඉල්ලීමට ඉඩදෙමින් ඉහත දී ආර්. ඒ. රත්නවතී රූපසිංහ යන අය එකී ආදේශ කිරීම සම්බන්ධයෙන් වග උත්තරකාර මණ්ඩලය විසින් විරෝධතාවක් නොදැක්වූ අතර, ඒ අනුව ඇයව ආදේශිත ඉල්ලුම්කාරිය වශයෙන් පිළිගන්නා ලදී.

6. අනතුරුව නඩුවේ වාචික සාක්ෂි දීම අවසන් කිරීම නිසා ලකුණු කළ ලේඛන සමග දෙපාර්ශවයේ ලිඛිත සැලකිරීම් ඉදිරිපත් කරන ලෙසට බේරුම්කරණය විසින් නියම කරනු ලදුව වගඋත්තරකාර පාර්ශ්වය පමණක් ලකුණු කළ ලේඛන සමග 2015.09.03 දතමින් තමා ලිඛිත දේශන ඉදිරිපත් කර ඇතත් ඉල්ලුම්කාර පාර්ශ්වය ලිඛිත දේශන 2015.09.03 දින දකවා ගොනු කර නොමැති අතර, එකී ලිඛිත දේශන 2015.09.22 වන දින ප.ව. 2.30 ට පෙර ගොනු කරන ලෙසට ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් පෙනී සිටි නීතිඥවරයා වන ඊ. එම්. ගුණපාල මහතාට දන්වා ඇතත් එකී ලිඛිත දේශන මේ දක්වා ගොනු කර නොමැත. පසුව කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරිවරයා විසින් ඉහත කී පළමු පාර්ශ්වයේ නීතිඥ ගුණපාල එදිරිමාන්න මහතාට සහ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට පිටපත් සහිතව ඉහත කී ඉල්ලුම්කරුගේ ලිපිනයට යවා ඇති 2015.11.02 දින දරන ලිපිය මගින් ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් සති දෙකක් ඇතුළත ලිඛිත දේශන ගොනු නොකරන්නේ නම් ඉල්ලුම්කාර පාර්ශ්වයේ ලිඛිත දේශන නොමැති සේ සළකා තීන්දුව සහ ප්‍රදානය ලබා දීමට බේරුම්කරණය විසින් තීරණය කර ඇති බව දක්වා ඇතත් ඒ අනුවද ඉහත කී ඉල්ලුම්කාර පාර්ශ්වයේ ලිඛිත දේශන ගොනු කර නොමැත.

7. මේ අනුව නඩු විභාගයේදී ඉදිරිපත් වූ සාක්ෂිත් වගඋත්තරකාර පාර්ශ්වය ඉදිරිපත් කළ ලකුණු කළ ලේඛන සහ ලිඛිත සැලකිරීම් ද සමස්ථයක් ලෙස සැලකිල්ලට ගනිමින් මෙම බේරුම්කරණය විසින් විසඳිය යුතු ප්‍රශ්න වන්නේ කම්කරු කොමසාරිස්ගේ ඉහත කී 2007.05.17 දින දරන යොමුවේ දක්වෙන

i. සී/ස සබරගුමුව බස් සමාගම යටතේ මාවනැල්ල ඩිපෝවට අනුයුක්තව සේවය කරමින් සිටියදී ඒ. පී. එච්. ජී. සී. ජයවීර මහතා 2004.09.01 දින සිට බලපවත්නා පරිදි III ඒ ශ්‍රේණියට උසස් කරමින් එම සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ විසින් නිකුත් කරණු ලැබූ 2004.08.30 දිනැති ලිපිය නීත්‍යානුකූල ලිපියක් වශයෙන් සැළකිය හැකි වන්නේ ද?

ii. එය නීත්‍යානුකූල ලිපියක් වන්නේ නම් ඒ අනුව ඒ. පී. එච්. ජී. සී. ජයවීර මහතා III ඒ ශ්‍රේණියට උසස්වීම් සඳහා හිමිකම් ලබන්නේ ද යන්න හා

iii. ඒ. පී. එච්. ජී. සී. ජයවීර මහතාට ලැබිය යුතු අනෙකුත් සහනයන් කුමක්ද යන්න වේ.

8. මෙම නඩුවේ වගඋත්තරකාර මණ්ඩලය විසින් නඩු විභාගයේදී ලකුණු කළ ලේඛන තම ලිඛිත සැලකිරීම් 2015.09.03 දාතමින් යුතුව ඉදිරිපත් කර ඇතත් මෙම නඩුවේ පැමිණිලි පාර්ශ්වය තම ලකුණු කළ ලේඛන සමග ලිඛිත සැලකිරීම් බේරුම්කරණය වෙත ගොනු කර නොමැත. මේ අනුව මෙම නඩුව 2015.09.03 දින බේරුම්කරණය විසින් නඩුව කැඳවා 2015.09.22 දින ප.ව. 2.30 ට පෙර සිය ලිඛිත දේශන ගොනු කරන ලෙස ආදේශිත ඉල්ලුම්කාරිය වෙනුවෙන් පෙනී සිටින නීතිඥ ගුණපාල මහතාට බේරුම්කරණය විසින් දන්වා ඇත. ඊට අතිරේකව කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරිවරයාගේ 2015.11.02 දින දරන ලිපිය මගින් ද නීතිඥ ගුණපාල එදිරිමාන්න මහතාට සහ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට පිටපත් සහිතව පැමිණිලිකරුගේ ලිපිනයට යවා ඇති ලිපිය මගින් දන්වා ඇති පරිදි ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් ලිඛිත දේශන ගොනු කර නොමැති බැවින්, ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් සති 2ක් ඇතුළත ලිඛිත දේශන ගොනු නොකරන්නේ නම් ඉල්ලුම්කාර පාර්ශ්වයේ ලිඛිත දේශන නොමැති සේ සලකා තීන්දුව හා ප්‍රදානය ලබා දීමට බේරුම්කරු තීරණය කර ඇති බවද දන්වා ඇත.

9. අනතුරුව 2015.12.02 දාතමින් කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරිවරයා සටහනේ දක්වා ඇත්තේ තම 2015.11.02 දින දරන ලිපිය ආපසු කාර්මික අධිකරණය වෙත ලැබී නැති බැවින් එකී ලිපිය ලැබී ඇතැයි විශ්වාස කරන බවත්, තමන් නීතිඥ ගුණපාල මහතාට දුරකථනයෙන් දැන්වූ විට ආදේශිත ඉල්ලුම්කාරිය මේ සම්බන්ධව උනන්දුවක් නොදක්වන බැවින් ලේඛන ඉදිරිපත් නොකරන බවත්, තමන්ට දැන්වූ බවය.

10. මෙම තත්ත්වය මත ඉල්ලුම්කාර පාර්ශ්වයේ ලිඛිත දේශන හා ලකුණු කළ ලේඛන බේරුම්කරණය වෙත ඉදිරිපත් කිරීමට මේ දක්වා ආපොහොසත් වී ඇති බැවින් මෙම නඩුවේ තීන්දුව හා ප්‍රදානයන් ලබා නොදීමට තීරණය කරමි.

11. මෙය සාධාරණ හා යුක්ති සහගත තීන්දුවක් ලෙස මම සලකමි.

පී. දනන්සූරිය,
බේරුම්කරු,

වර්ෂ 2016 ක් වූ මැයි මස 11 දින කොළඹ දී ය.

11 - 22

මගේ අංක : IR/21/41/2011

## කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2014.01.08 දිනැති හා අංක 1844/57 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2013.12.24 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පිටකෝට්ටේ, කෝට්ටේ පාර, අංක 416 පිහිටි ජාතික සේවක සංගමය (කේ. ඩබ්. ඩබ්. පී. ප්‍රනාන්දු මහතා වෙනුවෙන්) හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත හී පිහිටි ලංකා විදුලිබල මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2016.05.23 දිනැති ප්‍රදානය පළ කරනු ලැබූ 2016.06.08 දිනැති 1970/39 දරන *ගැසට් නිවේදනය* අවලංගු කර නව ප්‍රදානය ලෙස 2016.09.26 දිනැති සංශෝධිත ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2016 ඔක්තෝබර් මස 11 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය IR/21/41/2011.

### කොළඹ කාර්මික අධිකරණයේ දී ය.

ජාතික සේවක සංගමය
(කේ. ඩබ්. ඩබ්. පී. ප්‍රනාන්දු මයා වෙනුවෙන්)
අංක 416, කෝට්ටේ පාර, පිටකෝට්ටේ.

නඩු අංකය : ඒ - 3534 ඉල්ලුම්කරු

ලංකා විදුලිබල මණ්ඩලය
අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

වගඋත්තරකරු

දෙපාර්ශ්වය අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද

කම්කරු හා කම්කරු සබඳතා ඇමතිවන ගාමිණී ලොකුගේ මැතිතුමා මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ගරු ඇමතිතුමා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කර ඇත.

දෙපාර්ශ්වය අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කාරණය වූයේ

ලංකා විදුලිබල මණ්ඩලයේ සේවයේ නියුතු කේ. ඩබ්. ඩබ්. පී. ප්‍රනාන්දු මහතාට එරෙහිව පවත්වන ලද විනය පරීක්ෂණයේ නියෝගය අනුව 2007 වර්ෂය සඳහා ගෙවන ලද වැටුප් වර්ධකය අඩුකිරීමත්, ලංකා විදුලිබල මණ්ඩලයේ උසස්වීම පටිපාටියට අනුව පළමු ශ්‍රේණියේ පාලන මැදිරි ක්‍රියාකරු ලෙස උසස්වීම ලබා නොදීමත්, එයට අදාළ අනෙකුත් දීමනා නොලැබීමත් හේතුවෙන් ඔහුට යම් අසාධාරණයක් සිදුවූයේ ද යන්න සහ එලෙස අසාධාරණයක් සිදුවූයේ නම් ඔහුට කුමන සහනයක් හිමිවිය යුතු ද යන්න පිළිබඳව වේ.

ප්‍රදානය

මෙම නඩුව විභාග කිරීම සඳහා 2014.06.08 වන දින මා වෙත යොමු කිරීමෙන් අනතුරුව වතාවන් 15 කදී මුල් ප්‍රකාශ, දෙවන ප්‍රකාශ, ප්‍රති උත්තර, ලිඛිත දේශන වශයෙන් ඉල්ලුම්කාර පාර්ශ්වය සහ වගඋත්තරකාර පාර්ශ්වය මා වෙත ලිඛිතව කරුණු ඉදිරිපත් කළ අතර, මේ සියළු කාරණා පිළිබඳව සලකා බලා මා විසින් පහත නිගමයන්ට එළඹෙන ලදී.

මෙහි ඉල්ලුම්කාර පාර්ශ්වය අනවසර විදුලිය ලබා ගැනීමක් සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශ්වය විනය පරීක්ෂණයක් ආරම්භ කර ඇත්තේ 2007.02.19 වන දින හෝ ඊට ආසන්න දිනක බව අනාවරණ වී ඇත.

වගඋත්තරකාර මණ්ඩලයේ පිළිතුරු ප්‍රකාශයේ සඳහන් වන පරිදි කේ. ඩබ්. පී. ප්‍රනාන්දු යන අයට එරෙහිව 2007.07.03 වන දින චෝදනා පත්‍රයක් ලබා දී ඇත. චෝදනා පත්‍රය අනුව විධිමත් විනය පරීක්ෂණය 2007 වර්ෂයේ දෙසැම්බර් මස අවසන් කර ඇත. එමගින් 2010.04.12 වන දින විනය නියෝගයක් ඉල්ලුම්කරුට නිකුත් කර ඇත. ඒ අනුව පැහැදිලි වන්නේ විධිමත් විනය පරීක්ෂණය අවසන් කර වසර 3 ක් ප්‍රමාද කර විනය නියෝගය නිකුත් කර ඇති බවය. මේ පිළිබඳව වගඋත්තකාර මණ්ඩලය පිළිගෙන ඇත. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට අනුව බලධාරියාගේ කාර්ය භාරය අනුව යුක්තිය පසඳිලීම ප්‍රමාද වීම යුක්තිය ඉටු නොකිරීමක් වන්නේය යන්න මා විසින් අවධානය යොමු කළ බව ප්‍රකාශ කරමි.

වසර 3 ක් ප්‍රමාද කර දෙනු ලැබූ විනය නියෝගයට මාගේ අවධානය යොමු කරන ලදී. මෙම විනය නියෝගයෙන් ඉල්ලුම්කරු චෝදනාවන්ට වරුදිකරු බව සනාථ වී නැත. එසේම ඉල්ලුම්කරුට එරෙහිව හලාවත මහේස්ත්‍රාත් අධිකරණයේ මෙම චෝදනාව සම්බන්ධයෙන් පැවති නඩු විභාගයේදී 2010.10.07 වන දින මහේස්ත්‍රාත් තුමා විසින් ඉල්ලුම්කරුව නිදොස් කොට නිදහස් කර ඇති බව මා නිරීක්ෂණය කරමි.

2007 වර්ෂය සඳහා ඉල්ලුම්කරුට ලබා දී තිබූ වැටුප් වර්ධකය විනය නියෝගය මගින් අඩුකර ඇති බව සඳහන්ව ඇත. 2007 වර්ෂය සඳහා වූ වැටුප් වර්ධකය පැමිණිලිකරු විසින් උපයාගත් වැටුප් වර්ධකයක් මිස ආයතනය විසින් ඔහුට ප්‍රදානය කරන ලද්දක් නොවන බවත් 2007 වැටුප් වර්ධකයට සුදුසුකම් ලැබීම සඳහා ඉල්ලුම්කරු විසින් පෙර වසර එනම් 2006 වර්ෂයේ දී පැමිණීම ප්‍රගතිය හැසිරීම හා යහපත් කල් ක්‍රියාව යන ගුණාංග සාර්ථකව පුගුණ කර ඇති බවට සනාථ කර උපයා ගන්නා ලද්දක් බවත් එසේම මෙම වැටුප් වර්ධකය ඔහු විසින් පුරා වසර 3 ක කාලයක් බුක්ති විඳි වරප්‍රසාදයකි. අවිධිමත් විනය නියෝගයකින් පුරා වසර 3 ක් බුක්ති විඳි වරප්‍රසාදත් උපයාගත් වාර්ෂික වැටුප් වර්ධක අහිමි කිරීම යුක්ති සහගත නොවන බව මාගේ හැඟීමයි.

තවද 2007 වර්ෂයේ උපයාගත් වාර්ෂික වැටුප් වර්ධකය විලම්භනය කිරීමක් ගැන විධිමත් ලිපියකින් 2008 වර්ෂයේ දී වගඋත්තරකාර මණ්ඩලය විසින් ලබා දී නැත. ඒ වෙනුවට වගඋත්තරකාර පාර්ශ්වය ඉල්ලුම්කාර පාර්ශ්වය වෙත 2008, 2009 වර්ෂ සඳහා ඉල්ලුම්කරුගේ කාර්යක්ෂමතාවයන් හා සේවය වෙනුවෙන් වාර්ෂික වැටුප් වැඩිවීම ලබා දීමට දෙබිඩි පිළිවෙතක් අනුගමනය කළ බව මා නිරීක්ෂණය කරමි. 2007.08.20 වන දින විනය පරීක්ෂණයක් පැවති බැවින් උසස්වීම් ලබා දීම අත්හිටවූ බවත් 2007 වර්ෂයේ ඔහුට ලබා දී තිබූ වැටුප් වර්ධකය අඩු කර ඇති නිසා පසුගිය වසර 3 ක කාලයක් වැටුප් වර්ධකය උපයා ගත යුතු ඇත.

වගඋත්තරකාර පාර්ශ්වය විසින් ඉල්ලුම්කරුට 2007 වර්ෂයට පමණක් නොව 2008, 2009 වර්ෂ සඳහා ද වාර්ෂික වැටුප් වැඩිවීම ලබා දීම සාධාරණ හා යුක්ති සහගත බව මම තීරණය කරමි. විනය නියෝගයකින් කප්පාදු කර ඉල්ලුම්කරුගේ වාර්ෂික වැටුප් වර්ධකය 2010 වසරේදී විශ්‍රාම යන අවස්ථාව වන විට උපයාගත් ඔහුට හිමි විශ්‍රාම වැටුපෙන් අඩුකර ඇත්තේ ද ඔහුගේ කිසිදු අනුදැනුමක් කිරීමකින් තොරව බව පැහැදිලි වේ.

ඉල්ලුම්කරුට හිමිවිය යුතු පළමුවන ශ්‍රේණියේ උසස්වීම සහ ඊට අදාළ පඩිනඩි ගෙවීම නීත්‍යානුකූල බවත්, අඩු කරන ලද වැටුප් වර්ධකය නැවත ලබා දීමට කටයුතු කළ යුතු බවත් මා නිගමනය කරමි. එබැවින් ඉහත කරුණු සලකා බලා විදුලි මණ්ඩලයේ සේවයේ නියුතුව සිටි කේ. ඩබ්. ඩබ්. පී. ප්‍රනාන්දු මහතාට එරෙහිව පැවති විනය පරීක්ෂණයේ නියෝග අසාධාරණ බවත් ඉල්ලුම්කාර සේවකට වැටුප් වර්ධක අහිමි කිරීම උසස්වීම් පටිපාටියට අනුව පළමුවැනි ශ්‍රේණියේ පාලක මැදිරි ක්‍රියාකරු ලෙස උසස්වීම හා ඊට අදාළ පඩි නඩි නොලැබීම තුලින් අසාධාරණයක් සිදුවී ඇති බවයි.

ඒ අනුව ඉල්ලුම්කරුට හිමිවිය යුතු අඩුකරන ලද වැටුප් වර්ධකය ලබා දෙන ලෙසත් පළමුවැනි ශ්‍රේණියට උසස්වීම හා ඒ අනුව ලැබිය යුතු වැටුප් වර්ධක හා දීමනා ලබා දීමටත් නියෝග කරමි.

මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළවී මාස තුනක් ඇතුළත මෙම නියෝගය ක්‍රියාත්මක විය යුතු බවට ප්‍රකාශ කරමි.

එය සාධාරණ හා යුක්ති සහගත යැයි මාගේ හැඟීම හෙයින් ඒ අනුව මාගේ ප්‍රදානය මෙසේ නිකුත් කරමි.

සියළුම වැටුප් වර්ධකයන් දීමනා හා වන්දි උපරිමය රු.240,000/- ක් ඉක්ම නොවිය යුතු අතර, අදාළ වන්දි මුදල් වගඋත්තරකර පාර්ශ්වය විසින් දකුණු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ ඉල්ලුම්කරුගේ නමින් තැන්පත් කළ යුතු බවට නියෝග කරමි.

නීතිඥ කේ. ඒ. ට්‍රෙවෝ ප්‍රනාන්දු,
බේරුම්කරු,
කාර්මික අධිකරණය.

2016 සැප්තැම්බර් මස 26 දින දී ය.

11 - 23

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.